200489
බ
2014/10/17

සි. සං /-

# බුදුසමයෙහි එන වජ්ජ සංකල්පය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

පාතේගම ඤාණිස්සර හිමි
GS/Ph.D/BP/3248/07

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනශූරී උපාධි පරීක්ෂණය සඳහා

බෞද්ධ දර්ශනය විෂය යටතේ ඉදිරිපත් කෙරෙන නිබන්ධය.

Libary - USJP
200489

200489

## අපේක්ෂකයාගේ ප්‍රකාශය

මෙම ශාස්ත්‍රීය නිබන්ධය මහාචාර්ය ආරියපාල පෙරේරා සහ ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර යන සදුපදේශක වරුන්ගේ සුපරීක්ෂාව යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මෙහි ඇතුළත් පරිච්ඡේදයක් හෝ කොටසක් වෙනත් නිබන්ධයකින් හෝ ප්‍රකාශනයකින් උපුටා නොගත් බවත්, මේ නිබන්ධය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක්/ඩිප්ලෝමාවක් සඳහා හෝ ඉදිරිපත් නො කරන ලද බවත් 2010.11.04 දින පැවති වාචික පරීක්ෂණයේ දී නිබන්ධ පරීක්ෂකවරුන් පෙන්වා දුන් සංශෝධන සියල්ල සදුපදේශකතුමන්ලාගේ අධීක්ෂණය හා උපදෙස් පරිදි නිසිලෙස සම්පූර්ණ කළ බවත් සහතික කරමි.

...........................................

2010/11/08

පාතේගම ඤාණිස්සර හිමි

GS/Ph.D/BP/3248/07

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
පුස්තකාලය

# සදුපදේශක වරුන්ගේ නිර්දේශය

පහත අත්සන් කරන අපගේ සුපරීක්ෂණය යටතේ පර්යේෂණය කොට සකස් කළ "බුදුසමයෙහි එන වජ්ජ සංකල්පය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්" නැමති මෙම නිබන්ධය පිළිබඳව 2010.11.04 දින ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ දී පැවති වාචික පරීක්ෂණයේ දී නිබන්ධ පරීක්ෂකවරුන් විසින් පෙන්වා දී ඇති සියලු සංශෝධන නිසි පරිදි සංස්කරණය කර ඇති බවත්, මෙම සංශෝධිත නිබන්ධ පිටපත් පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයට භාරදීමට සුදුසු තත්ත්වයක පවතින බවත් සහතික කරමු.

08.11.2010
.................................
දිනය

.................................
මහාචාර්ය ආරියපාල පෙරේරා

.................................
දිනය

.................................
ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර

# පටුන

පිටු අංක


පළමුවන පරිච්ඡේදය

වජ්ජ සංකල්පය : මූලාශ්‍ර ගවේෂණය 13-64

1.1 වජ්ජ : පද විභාගය 13-16

1.2 වජ්ජ : කෝෂාර්ථ 16-18

1.3 බුදුසමයෙහි දක්වෙන වජ්ජ හා දඬුවම් පිළිබඳ විවිධ විග්‍රහ 18-39

1.4 වජ්ජ සංකල්පය : සූත්‍ර ධර්ම ඇසුරින් සොයා බැලීමේ අවශ්‍යතාවය 39-51

1.5 වජ්ජ සංකල්පය : බෞද්ධ විනය පිටකය ඇසුරින් විමසා බැලීම. 51-58

1.6 වජ්ජ සංකල්පය : පූර්ව අටුවා, අටුවා, ටීකා සහ ප්‍රකරණ ග්‍රන්ථවලදී සංවර්ධනය වී ඇති ආකාරය 59-64

දෙවන පරිච්ඡේදය

බුදුසමයෙහි දක්වෙන වජ්ජ සංකල්පය 65-114

2.1 වජ්ජ යනු කුමක්ද? 65-80

2.2 සූත්‍ර ධර්මවල වජ්ජ විස්තරවන ආකාරය 80-88

2.3 කුමක් හෙයින් වජ්ජ වන්නේද? 88-92

2.4 වජ්ජ සංකල්පයේ ස්වභාවය 92-97

2.5 තමාට සමාජයට හා දේපල වලට එරෙහිව වැරදි කිරීමේ ආරම්භය 97-100

2.6 සාවද්‍ය දෘෂ්ටිය පිළිබඳ බෞද්ධ මතය 101-107

2.7 වරදට ලැබෙන දඬුවම් 107-111

2.8 වජ්ජ පිළිබඳ වර්ගීකරණයක් 111-114

තෙවන පරිච්ඡේදය

පඤ්ඤත්තිවජ්ජ සංකල්පය හා එහි ස්වභාවය 115-185

3.1 පඤ්ඤත්ති වජ්ජ බුදුසමයේ විස්තර වන ආකාරය 115-117

3.2 පඤ්ඤත්ති වජ්ජය නීතිය බවට පත්වන ආකාරය 118-120

3.3 පඤ්ඤත්ති විනය පැනවීමේ අවශ්‍යතාව 121-145

3.4 පඤ්ඤත්ති වජ්ජයෙහි ස්වභාවය 145-185

සිවුවන පරිච්ඡේදය

ලෝකවජ්ජ සංකල්පය හා එහි ස්වභාවය 186-274

4.1 ලෝකවජ්ජ සංකල්පය (දස අකුසල කර්මපථ) සමාජ අපරාධවලට සම්බන්ධ වන ආකාරය 186-195

4.2 ප්‍රාණඝාතය හා සමාජ අපරාධ 195-223

4.3 අදින්නාදානය හා සමාජ අපරාධ 224-242

4.4 කාමමිථ්‍යාචාරය හා සමාජ අපරාධ 243-255

4.5 වාග් දුශ්චරිතය හා සමාජ අපරාධ 256-266

4.6 මනෝ දුශ්චරිතය හා සමාජ අපරාධ 266-274

පස්වන පරිච්ඡේදය

සමාලෝචනය හා නිගමනය 275-281

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 282-290

# ස්තුතිය

බුදුසමයෙහි දක්වෙන අපරාධ විද්‍යාත්මක සංකල්ප කෙරෙහි මගේ සිත ඇදීගියේ මහාචාර්ය නන්දසේන රත්නපාලයන්ගේ කෘති කියවීමෙනි. ඒ අනුව එතුමා හමුවී කථා බහ කිරීමෙන් එම අදහස් වඩාත් සංවර්ධනය වූ අතර පර්යේෂණ ගැටලුව ද මතු කර ගත හැකි විය.

අනතුරුව නිබන්ධ මාතෘකාව සකස් කර ගැනීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ඥානදාස පෙරේරා මහතා සහ බෞද්ධ අධ්‍යයන අංශ ප්‍රධාන ආචාර්ය නායිම්බල ධම්මදස්සි හිමි යන ආචාර්යවරුන්ගෙන් විවිධ මග පෙන්වීම් ලැබුණි.

මාතෘකාව අනුමත කර ගැනීමෙහි හා සාහිත්‍ය සමීක්ෂා සඳහා ඉදිරිපත් කළ සම්මන්ත්‍රණවලදී සහ වෙනත් අවශ්‍ය සෑම අවස්ථාවකදී ම අදාළ කරුණු කියාදුන් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඔලිවර් අබේනායක ගුරුතුමාණන්ගෙන් මගේ පර්යේෂණ ඥානය පුළුල් වන පරිදි සදුපදේශ ලැබුණි.

නිබන්ධයේ සියලු කටයුතු අවසන් කරනු ලැබුවේ මහාචාර්ය ආරියපාල පෙරේරා සහ ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර යන ආචාර්යවරුන්ගේ සුපරීක්ෂාව යටතේ ය. මේ පර්යේෂණ කාර්යය සඳහා එම ගුරුතුමන්ලාගෙන් ලැබුණ අපරිමිත මග පෙන්වීම නිබඳව ම සිහිපත් කරමි.

මාහට මතු වූ පර්යේෂණ ගැටලුවලදී නිවැරදි මගපෙන්වීම් කළ, මහාචාර්ය ධම්මවිහාරී හිමි, මහාචාර්ය තිලක් කාරියවසම්. මහාචාර්ය සුමනපාල ගල්මංගොඩ, මහාචාර්ය තිස්ස කාරියවසම්, ආචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ යන සුධීහු මේ පර්යේෂණ කාර්යයේදී මට ශාස්ත්‍ර දානය කළ ගුරු උතුමන් කොට සලකමි.

ශාස්ත්‍රීය පොතපත සොයා දීමෙන් උපකාර කරනු ලැබුවේ රාජකීය පණ්ඩිත රත්කරව්වේ පේමානන්ද හිමියන් ය. මෙම ශාස්ත්‍රීය කාර්යය ආරම්භයේ සිට සියලු අයුරින් උපකාර කළ නම් සඳහන් කළ නො කළ සියලු ම සද්ජන උතුමන් නොවිතර ස්නේහයෙන් සිහිපත් කරමි.

# බුදුසමයෙහි දක්වෙන වජ්ජ සංකල්පය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

## නිබන්ධ සාරාංශය

පාළි සූත්‍ර හා විනය පිටකයෙහි ද අටුවා ග්‍රන්ථවල ද, ඇතුළත් කරුණු අනුව වජ්ජ සංකල්පය හඳුනාගෙන එම සංකල්පය අපරාධ විද්‍යාව සහ නීතිය සමඟ තුලනාත්මක ව සාකච්ඡා කිරීම මෙම අධ්‍යයනයේ අරමුණයි. මෙහි පළමුවන පරිච්ඡේදයෙහිදී, ප්‍රස්තුත මාතෘකාව තෝරා ගැනීමේ කාලීන අවශ්‍යතාව ද වජ්ජ සංකල්පය සහ ඊට අදාල සාහිත්‍ය සමීක්ෂාව ද සිදු කර ඇත. අංගුත්තර නිකායේ සඳහන් වන වජ්ජ සූත්‍රය හා කෝෂාර්ථ ඇසුරින් එම සංකල්පය හඳුනාගෙන බෞද්ධ සූත්‍ර හා විනයෙහි වජ්ජ යන වචනය සඳහා භාවිත වී ඇති පරියාය පද අවධානයට ලක් කරන ලදී. මුල් බුදුසමයේ දක්නට ලැබුණු වජ්ජ සංකල්පය අටුවා සාහිත්‍යයෙහි දී වර්ගීකරණය වී සංවර්ධනය වී ඇති ආකාරය ද සාකච්ඡා කොට ඇත.

දෙවන පරිච්ඡේදයෙහි දී බුදුසමයෙහි දක්වෙන වජ්ජ සංකල්පය පිළිබඳ ව හා බුදුසමයෙහි මූලික අරමුණ පිළිබඳ ව කරුණු දක්වා, අනතුරු ව ඒ සඳහා පුද්ගලයා මෙහෙයවන ප්‍රේරණ, වජ්ජ යනු කුමක්ද? කාම රාගය, ස්ත්‍රී පුරුෂ බව, සිත, කුඩා වරද, ඉන්ද්‍රිය සංවරය, කුමක් හෙයින් වජ්ජ වන්නේ ද යන වග, වජ්ජ සංකල්පයේ ස්වභාවය, ප්‍රභවය, පිළිබඳ ව සාකච්ඡා කරයි. එම පරිච්ඡේදයේදී ම මූලාශ්‍ර ඇසුරින් පුද්ගලයා වරද තමාට සමාජයට හා දේපලවලට එරෙහි ව සිදු කිරීමට පොළඹවන මානසිකත්වය ද, සාවජ්ජ දෘෂ්ටිය පිළිබඳ ව බෞද්ධ මතවාදය ද බුදුසමයෙහි දැක්වෙන වජ්ජ සංකල්පය පිළිබඳ ව ද සාකච්ඡා කරයි.

තුන්වන පරිච්ඡේදයෙහි දී බුදුසමයෙහි දක්වා ඇති පණ්ණත්තිවජ්ජ සංකල්පය හා එහි ස්වභාවය පිළිබඳව සාකච්ඡා කරයි. පණ්ණත්තිවජ්ජ යනු කුමක්ද? බුදුසමයේ දැක්වෙන පණ්ණත්තිවජ්ජය, පණ්ණත්ති විනය නීති මාලාවක අවශ්‍යතාව පණ්ණත්තිවජ්ජ වර්ගීකරණය

යන අනුමාතෘකා යටතේ සාකච්ඡා කරයි. බුදුසමයේ දැක්වෙන පඤ්ඤත්ති නීති මාලාව පිළිබඳ ව කරන විග්‍රහයේදී බෞද්ධ භික්ෂු සමාජය හා සම්බන්ධ නීති මාලාව විෂයෙහි අවධානය දක්වා තිබේ. බෞද්ධ විනය නීති සාකච්ඡා කරනු ලබන්නේ, අපරාධ විද්‍යාව, අපරාධ නීතිය හා සාමාන්‍ය නීති හා තුලනාත්මකවයි. මේවායේ පවත්නා සමානකම් සහ අසමානකම් ගැන ද සාකච්ඡා කරන ලදී.

සතරවන පරිච්ඡේදය ලෝකවජ්ජ සංකල්පය සහ එහි ස්වභාවය පිළිබඳව සාකච්ඡා කිරීමට වෙන් වෙයි. සූත්‍ර හා අටුවා විනය නීතිවල ලෝකවජ්ජ ලෙස දක්වා ඇත්තේ සචිත්තක පක්ෂයේ දස අකුසල කර්මපථ පිළිබඳව යි. ඒ අනුව ප්‍රාණඝාතය සහ සමාජ අපරාධ, අදින්නාදානය හා සමාජ අපරාධ කාමමිථ්‍යාචාරය හා සමාජ අපරාධ, වාග් දුශ්චරිතය හා සමාජ අපරාධ, මනෝ දුශ්චරිතය පුද්ගල මනස හා සමාජ අපරාධ, අනුමාතෘකා යටතේ ලෝකවජ්ජ සහ එහි ස්වභාවය පිළිබඳව සාකච්ඡා කරයි. අදාළ තැන්වල අපරාධ විද්‍යාව හා අපරාධ නීතිය සමඟ තුලනාත්මකව මූලික සූත්‍රවල ඇතුළත් කරුණු සාකච්ඡා වෙයි.

පස්වන පරිච්ඡේදය සමාලෝචනය සහ නිගමනය ඉදිරිපත් කිරීම සඳහා වෙන් කොට ඇත.

# හැඳින්වීම

බුදුසමයෙහි එන වජ්ජ සංකල්පය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් නැමති මෙම පර්යේෂණයෙහි "බුදුසමයෙහි එන" යන වචනයෙන් අදහස් කරන්නේ ථේරවාද සම්ප්‍රදාය යන්නයි. වජ්ජ යන පාළි පදයේ තේරුම වන්නේ වරද, දෝෂය, හෙවත් අපරාධය යි. අපරාධකාරී මානසිකත්වය නිසා පුද්ගලයා සාපරාධී ක්‍රියාවලට නැඹුරු වෙයි. අපරාධකාරයා සඳහා ආගුචාරී යනුවෙන් බුදුසමයේ භාවිත වේ. ලෝභ, දෝස, මෝහ, නැමති අකුසල මූලයන් හේතුවෙන් වරදට නැඹුරු වන මිනිසා කරනු ලබන අපරාධ විවිධ ය. වජ්ජ යන වචනයෙන් හඳුන් වන බෞද්ධ අපරාධ සංකල්පය වර්තමාන නීති ක්ෂේත්‍රය හා අපරාධ විද්‍යා සංකල්ප සමඟ තුලනාත්මක ව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අපේක්ෂාව යි.

මුල් බුදුසමයේ දක්නට ලැබෙන වජ්ජ සංකල්පය පසුකාලීන පූර්ව අටුවා සහ අටුවා ග්‍රන්ථවලදී වඩාත් සංවර්ධනය වී තිබේ. අපරාධය, වඩාත් විධිමත් ලෙස වර්ගීකරණය වීමක් ඒ අනුව දක්නට ලැබේ. මිනිසාගේ සන්තානගත සමාජගත සහ සංසාරික ජීවිතය අර්ථවත් කිරීමේ මූලික අරමුණින් වජ්ජ දේශනාව සිදු කරනු ලැබ ඇති බව දක්නට ලැබේ.

මෙම මාතෘකාව සාකච්ඡා වන්නේ බෞද්ධ ආචාර ධර්ම විෂය ක්ෂේත්‍රය යටතේ ය. ඒ අනුව සදාචාරවත් සමාජයක් ගොඩනැගීම පිණිස මෙම සංකල්පය නීති ක්ෂේත්‍රයට ද අත්‍යවශ්‍ය වී තිබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, දණ්ඩ නීති සංග්‍රහය, අපරාධ නීතිය සහ සිවිල් නීතිය යන අංශ කෙරෙහි ද අවධානය යොමු කරමින් බෞද්ධ වජ්ජ සංකල්පය මෙහිලා සාකච්ඡා කර තිබේ.

පූර්ණ කාලීන වශයෙන් සහ අර්ධ කාලීන වශයෙන් ශාසනික ප්‍රතිපදා පුරන අයහට වජ්ජ සංකල්පය යයි දෙ විධියකට දේශනා කොට තිබීමෙන් හෙළි වන බෞද්ධ නීති දර්ශනය වර්තමාන නීති අණ පනත් පැනවීමේ දී අනුගමනය කරනු ලබන පිළිවෙත් වඩාත් අර්ථවත් කර ගැනීමට හේතු වෙයි. වර්තමාන නීති ක්ෂේත්‍රය ද, අපරාධ විද්‍යා ඥානයන් ද

සමඟ බුදුසමයේ දක්වෙන කරුණු රැස්කර සාකච්ඡා කිරීම වඩාත් අර්ථ සම්පන්නව සිදු කර තිබේ.

බෞද්ධ මූල ග්‍රන්ථ අටුවා ග්‍රන්ථ සහ අනෙකුත් බෞද්ධ ග්‍රන්ථ අධ්‍යයනය කර බලන විට දක්නට ලැබෙන්නේ වජ්ජ හෙවත් අපරාධය නැමති සංකල්පය වඩාත් පුළුල් අරුතකින් සාකච්ඡා කර තිබෙන බවයි. වජ්ජ යන වචනයෙන් කියවෙන අදහස සඳහා මුල් බුදුසමයේ පරියාය වචන කීපයක්ම භාවිත වී ඇති බව කිව යුතු ය.

අටුවා ග්‍රන්ථවලට ද අමතර ව ඒ ඒ යුගවල වැඩ වාසය කළ විනය පිළිබඳ ප්‍රවීණත්වය දරූ මහ තෙරවරුන් වහන්සේලා ද විනය කඩකිරීම් පිළිබඳ නඩු විභාගවලදී ලබා දී ඇති විනිශ්චයන් නිසා ද වජ්ජ සංකල්පය කාලීන සමාජ පරිසරයට අනුගතව වර්ධනය වී ඇති ආකාරය දක්නට ලැබේ. මහා තෙරවරුන් විසින් නඩුවල දී ලබා දී තිබෙන තීන්දු සහිත නඩු වාර්තා පසු කාලීන ව සාපරාධී ක්‍රියාවක් සහ චේතනාව සහිත නිර්ණයන් වලට පූර්වාදර්ශ වී තිබේ.

බුදුසමයේ සඳහන් වන වජ්ජ සංකල්පය දිගු කාලයක් තිස්සේ ක්‍රමයෙන් වර්ධනය වී ඇති අයුරු දක්නට ලැබේ. ඒ පිළිබඳ ව කෙරුණු තුලනාත්මක අධ්‍යයනය ලෙස මෙම ශාස්ත්‍රීය අධ්‍යයනය හැඳින්විය හැකි ය.

## සංකේත නිරූපණය

අං.නි. - අංගුත්තර නිකාය

අත්ථ.සා. - අත්ථසාලිනී අට්ඨ කථාව

අප - අපරාධ නඩු විධාන සංග්‍රහය

අ.ප්‍ර. - අපණ්ණක ප්‍රතිපදාව

අ.නී.ථෙ - අපරාධ නීතිය සහ ථෙරවාද විනය

අ.ද. - අපරාධය හා දඬුවම

අ.වි.ර.ව. - අපරාධ විමර්ශනයට රස වසකයක්

අ.වි.මූ. - අපරාධ විද්‍යාවේ මූලධර්ම

අ.ඉ. - අසිරිමත් ඉන්දියාව

අ.ම.වි.උ. - අපරාධ මනෝවිද්‍යා සහ වින්දිත උපදේශනය

අ.කෝ. - අමරකෝෂය

ආ.සං.1 - ආයතන සංග්‍රහය 1

ආ.සං. 2 - ආයතන සංග්‍රහය 2

ආ.බු.නී. - ආදි බුදුසමයේ පැනෙන නීති දර්ශනය

ආ.ක. - ආතති කළමනාකරණය

ආ.ධ.අ. - ආචාර ධර්ම අත්පොත

අ.නී.මූ. - අපරාධ නීතියේ මූලිකාංග

උ.ප්‍රා. - උභය ප්‍රාතිමෝක්ෂය.

අ.බා.පු. - අපරාධ, බාලාපරාධ සහ පුනරුත්තාපනය

ඉ.ද. - ඉන්දීය දර්ශනය

ඉ.සා.ඉ. - ඉන්දීය සාහිත්‍ය ඉතිහාසය

කං.වි.මා. - කංඛාවිතරණීනාම මාතිකාට්ඨකථා

කංඛාවි.පා.ව. - කංඛාවිතරණීනාම පාතිමොක්ඛ වණ්ණනා

ක.වි. - කර්ම විභාගය

ක.නී.ස. - කම්කරු නීති සංග්‍රහය

කෙ.එ.ප. - කෙලෙස් එක්දහස් පන්සියය

කේ.එන්.ජ.ද. - කේ.එන්. ජයතිලක දර්ශනය

කු.වි - කුදුසික විවරණය

කු.ස. - කුදුසික සන්නය

ඛ.වි. - ඛන්ධක විනය

ඛු.නි. - ඛුද්දක නිකාය

චු.පා. - චුල්ලවග්ගපාලි

ජා.ක.අ.වි. - ජාතක කථාවල අපරාධ විද්‍යාත්මක ලක්ෂණ

දී.නි. - දීඝ නිකාය

ධම්.අ.ගැ. - ධම්පියා අටුවා ගැටපදය

ධ.වි. - ධර්ම විනිශ්චය

ධ.ක. - ධම්මපදට්ඨ කථා

පරි.පා - පරිවාරපාලි

පාලි.සිං.අ. - පාලි-සිංහල අකාරාදිය

පාලිං.සිං.ශ. - පාලි-සිංහල ශබ්දකෝෂය

පාලි.ශබ් - පාලි ශබ්දකෝෂය

පා.පා. - පාරාජිකාපාලි

පාචි.පා. - පාචිත්තියපාලි

පාලි.සා. - පාලිසාහිත්‍යය

පාලිඅ.ස. - පාලි අට්ඨකතා සාහිත්‍යය

පාලි.මු.වි.වි. - පාලිමුත්තක විනය විනිශ්චය

පාලි.ස.ඉ. - පාලි සාහිත්‍යයේ ඉතිහාසය

පුරා.ලං.නී. - පුරාණ ලංකාවේ නීති ක්‍රමය

ප්‍රාග්.ඉ.ඉ. - ප්‍රාග් ඉන්දීය ඉතිහාසය

ප්‍රාති.වි. - ප්‍රාතිමෝක්ෂ විවරණය

ප්‍රා.ති. දී. - ප්‍රාතිමෝක්ෂ දීපිකා

| | | |
|---|---|---|
| බුද්.බෞ.පැ.වි. | - | බුද්ධකාලීන බෞද්ධ පැවිදි දිවිය හා විනය |
| බුදු.අ.නී. | - | බුදුසමය සහ අන්තර්ජාතික නීතිය |
| බුදු.සා.ක. | - | බුදුදහම සාහිත්‍යය හා කලාව |
| බෞ.වි.ක. | - | බෞද්ධ විනය කර්ම |
| බෞ.ස. | - | බෞද්ධ සදාචාරය |
| බෞ.ශ | - | බෞද්ධ ශබ්ද කෝෂය |
| බෞ.ම.ප්‍ර. | - | බෞද්ධ මනෝවිද්‍යා ප්‍රවේශය |
| බෞ.වි.අ. | - | බෞද්ධ විනය අධ්‍යයනය |
| භි.භි.ප්‍රා.ව. | - | භික්ෂු-භික්ෂුණී ප්‍රාතිමෝක්ෂ වර්ණනාව |
| භි.ශා.භි.වි. | - | භික්ෂුණී ශාසනය සහ භික්ෂුණී විනය |
| ම.නි | - | මජ්ඣිම නිකාය |
| ම.පා. | - | මහාවග්ගපාලිය |
| මා.හි.මු.අ. | - | මානව හිමිකම් සහ මූලික අයිතිවාසිකම් |
| මිලින්ද | - | මිලින්ද පඤ්හෝ |
| මුළු.වි. | - | මුළුසික විවරණය |
| ලක්.වි.සා. | - | ලක්දිව විනය සාහිත්‍යය |
| වහ.ග. | - | වහලය ගලවන්න |
| වි.කො.1 | - | විනය කෝෂය 1 |
| වි.කො.2 | - | විනය කෝෂය 2 |
| ශ්‍රී.අ.ප.නි. | - | ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය අපරාධයට සම්පාදක ධාතු |
| ශ්‍රී.අ.ප.නි.තැ. | - | ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය තැත් කිරීම, අනුබල දීම හා පොදු චේතනාව |
| ශ්‍රී.බෞ.වි.දෙ | - | ශ්‍රී ලංකාවේ බෞද්ධ විවාහර හා දේපල නීතිය |
| සං.නි. | - | සංයුත්ත නිකාය |
| සමන්ත.පා. | - | සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා |
| සං.ශබ්. | - | සංස්කෘත ශබ්දාර්ණවය |

| | | |
|---|---|---|
| සිං.ශ. | - | සිංහල ශබ්දකෝෂය |
| සීමා.වි. | - | සීමා විනිශ්චය |
| සුමං.ශ.කො. | - | සුමංගල ශබ්දකෝෂය |

**English**

| | | |
|---|---|---|
| Dic.E.S. | - | Dictionary English and Sanskrit |
| E.P.D. | - | English – Pali Dictionary |
| En.P.D. | - | English – Pali Dictionary |
| En.P.D. | - | The Pali - English Dictionary |